දැන්වීමයි!

කොළඹ මහා නගර සභාව

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ සහකාර ආරක්ෂක නිලධාරී/ආරක්ෂක නිලධාරී තනතුර සඳහා සිමිත බඳවා ගැනීම - 2026</u>

ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2020.09.30 දින අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ ආරක්ෂක පරිපාලක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සහ සහකාර ආරක්ෂක නිලධාරී සහ ආරක්ෂක නිලධාරී තනතුරු සඳහා පත් කිරීමේ පරිපාටිය අනුව සුදුසුකම්ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ආරක්ෂක සේවයේ පහත සඳහන් සුදුසුකම් ලත් සේවක මහත්ම/මහත්මින් සඳහා පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ද සහිතව 2026.08.06 දිනට පෙර නාගරික ලේකම්, නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

i. තනතුරු නාම :- බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ

- සහකාර ආරක්ෂක නිලධාරී
- ආරක්ෂක නිලධාරී

ii. වැටුප් කේත අංකය :- **MN 1 - 2025 (රා.ප.ව. අංක 10/2025 අනුව)**

iii. මාසික වැටුප් පරිමාණය :-**45230-10X 540 - 11 X 630 - 10 X 890 - 10 X 1190 - 78360/=**

- **සහකාර ආරක්ෂක නිලධාරී - ඉහත වැටුප් ක්‍රමයේ 12 වන පියවර ආරම්භක පියවර වේ.**
- **ආරක්ෂක නිලධාරී - ඉහත වැටුප් ක්‍රමයේ 23 වන පියවර ආරම්භක පියවර වේ.**

iv. මෙම තනතුර ස්ථීර විශ්‍රාම වැටුප් සහිතය.

v. තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් /වෘත්තීය සුදුසුකම් :- අදාළ නොවේ.

vii. පළපුරුද්ද :-

- සහකාර ආරක්ෂක නිලධාරී

  බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආරක්ෂක පරිපාලක තනතුරේ වසර 03 ක පළපුරුද්ද හා ආරක්ෂක පරිපාලක iii ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම.
- ආරක්ෂක නිලධාරී - සහකාර ආරක්ෂක නිලධාරී තනතුරේ වසර 03 ක පළපුරුද්ද

viii. වෙනත් **:-** තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

X. වයස් සීමාව :- අදාළ නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

04. ව්‍යුහගත **සම්මුඛ පරීක්ෂණය (**සහකාර ආරක්ෂක නිලධාරී)

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු	තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය
<u>අමතර සේවා කාලය</u> මූලික සුදුසුකම සඳහා සලකා බලන ආරක්ෂක පරිපාලක තනතුරේ වසර 03 ට අමතර සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 07ක් සඳහා)	35	අදාළ නොවේ
රාජකාරි කටයුතුවල දී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයකට ලකුණු 05 බැගින්)	15	
කාර්යසාධන ඇගයීම (පත්කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා) ඉතා හොඳයි - 09 හොඳයි - 06 සතුටුදායකයි - 03	45	
පෞරුෂත්වය	05	
එකතුව	100	

05. ව්‍යුහගත **සම්මුඛ පරීක්ෂණය -** ආරක්ෂක නිලධාරී

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	**උපරිම ලකුණු**	**තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය**
<u>අමතර සේවා කාලය</u> මූලික සුදුසුකම සඳහා සලකා බලන සහකාර ආරක්ෂක නිලධාරී තනතුරේ වසර 03 ට අමතර සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 07ක් සඳහා)	35	අදාළ නොවේ
රාජකාරී කටයුතුවල දී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයකට ලකුණු 05 බැගින්)	15	
කාර්යසාධන ඇගයීම (පත්කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා) ඉතා හොඳයි - 09 හොඳයි - 06 සතුටුදායකයි - 03	45	
පෞරුෂත්වය	05	
එකතුව	100	

06. තනතුර සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව

- සහකාර ආරක්ෂක නිලධාරී තනතුරු 05 යි
- ආරක්ෂක නිලධාරී තනතුරු 02 යි

2026.08.06 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අත්හැරීම් හා ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුවේ විෂයභාර නිලධාරියා වෙත පැවරේ.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද කොළඹ මහානගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඒ.ඩී.එස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

2026. ජූලි මස ..... වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.